# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.01.19 පැය 1945 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 93 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**නීති විරෝධීව එකලස් කරන ලද වාහනයක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් හිටපු අමාත්‍යවරයයෙකු අත්අඩංගුවට ගැනීම - වලාන මධ්‍යම දූෂණ මධර්න ප්‍රහාරක ඒකකය.**

2024.12.05 වන දින හපුතලේ පොලිස් වසමේදී වලාන මධ්‍යම දූෂණ මධර්න ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස මෙරටට ආනයනය කර එකලස් කර, කූට ලේඛණ සකස් කර, මෝටරර්ථ දෙපාතර්මේන්තුව වෙත ඉදිරිපත් කර ලියාපදිංචි කරන ලද ලොරි රථයක් හිටපු අමාත්‍ය ගාමිණී විජිත් විජයමුණි සොයිසාට අයත් හපුතලේ මුතුවාණා වත්තේ තිබියදී, අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්න සඳහා හපුතලේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අදාල වාහනය සම්බන්ධයෙන් සිදු කල වැඩිදුර විමශර්නයේදී, මෙය නිෂ්පාදිත ආකෘතියෙන් පරිබාහිරව එකලස් කර ඇති බවත් එන්ජින් සහ චැසි අංකද ව්‍යාජ ලෙස වෙනස් කර ඇති බවටත් තහවුරු වී ඇත. එමෙන්ම හිටපු අමාත්‍ය ගාමිණී විජිත් විජයමුණි සොයිසා විසින් මෙම රථයට අදාලව ලියාපදිංචි සහතිකය හා ආදායම් බලපත්‍රය නැති වූ බවට හපුතලේ පොලිස් ස්ථානය වෙත මීට පෙර පැමිණිල්ලක් සිදු කර ඇති බවටද වැඩිදුර විමශර්නයේදී අනාවරණය වී ඇත.

**ඒ අනුව 2025.01.19 වන අද දින දහවල් කාලයේදී නීති විරෝධීව එකලස් කරන ලද වාහනයක් සන්තකයේ තබා ගැනීමේ වැරදි වලට අදාලව සැකකරු වන වයස අවුරුදු 67 ක් වූ මුතුවානාවත්ත, හපුතලේ ප්‍රදේශයේ පදිංචි හිටපු අමාත්‍ය ගාමිණී විජිත් විජයමුණි සොයිසා යන අය වලාන දූෂණ මධර්න ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.**

සැකකරු වැඩිදුර විමශර්න කටයුතු සඳහා හපුතලේ පොලිස් ස්ථානයට භාර දීමට නියමිතව ඇත.

අත්අඩංගුවට ගත් ලොරි රථයේ ඡායාරූප කිහිපයක්







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**